# බුදුරජාණන් වහන්සේ විසින් ධර්ම කරුණු විස්තර කිරීමෙහිලා නිදර්ශිත සත්ත්වයන්ගේ ස්වරූපය, ත්‍රිපිටකාගත සූත්‍ර කිහිපයක් ඇසුරෙන් කෙරෙන විමර්ශනයක්

කරඳගොල්ලේ සෝභිත හිමි[1]

බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේගේ ධර්ම දේශනාවන්හි අන්තර්ගත ධර්ම කරුණු පැහැදිලි කිරීම සඳහා විවිධ උපමාවන් භාවිත කළසේක. ඒ අතරින් විශේෂ වන්නේ එම ධර්ම කරුණු විස්තර කිරිමෙහිලා විවිධ වු සත්වයන්ගේ චරිත උපමා කර ගැනීමයි. එම සත්ත්ව චරිත ආශ්‍රය කොටගෙන තමන් වහන්සේ දේශනා කරන ධර්ම කාරණය වඩා සවිස්තර වශයෙන් අවධාරණාත්මකව ඉදිරිපත් කිරීම මගින් ශ්‍රාවකයාට එය වටහා ගැනීමෙහිලා මනා පිටුබලයක් ලබාදීමට උන්වහන්සේ උත්සුක වී ඇති ආකාරය අපට දක්නට ලැබේ.

විශේෂයෙන් බුදුරජාණන් වහන්සේ, තමන්වහන්සේගේ ධර්මදේශනයන් සඳහා නිදර්ශිත සත්ත්ව චරිත අතර හංසයා, මොණරා, අශ්වයා, ඇතා, කඟවේණා ආදි සත්ත්වයන් රාශියක් දක්නට ලැබේ. එපමණක් නොව මී මැස්සන්, නාගයන්, වඳුරන්, කිකිළියන්, කැස්බෑවන් ආදි සත්ත්වයන්ගේ චරිත ස්වභාවයන් ද තම ධර්ම දේශනාවන්හි අනතර්ගත කරුණු විස්තර කිරීම සඳහා භාවිත කළසේක. එමගින් එම සත්ත්ව චරිතයන්හි පවත්නා සුවිශේෂී ගුණාංගයන් හා ලක්‍ෂණ උපමා වශයෙන් ගෙනහැර දක්වමින් ධර්ම කරුණු මෙන්ම මිනිසුන් සතුවිය යුතු ගුණාංගයන් රාශියක් විස්තර කිරීමට උත්සුක වී ඇත. එහිලා එම සතුන්ගේ බාහිර ස්වරූපයන්, චරිත ලක්‍ෂණ හා ඒ ඒ සතුන් යොදාගන්නා කාර්යයන්හි ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය ආදිය පිළිබඳ වැඩි අවධානයක් දක්වමින් කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය දක්නට ලැබේ.

ඒ අනුව මෙම පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කිරීම මගින් බලාපොරොත්තු වනුයේ ත්‍රිපිටකාගත සූත්‍ර ධර්ම කිහිපයක් ආශ්‍රයෙන් බුදුරජාණන් වහන්සේ විසින් තම ධර්මදේශනාවන් සඳහා නිදර්ශිත සත්ත්වයන්ගේ චරිත ලක්‍ෂණයන් පිළිබඳ කරුණු ගෙනහැර දැක්වීමටයි.

**ප්‍රමුඛ පද** : ධර්ම කරුණු, උපමා, සත්ත්ව චරිත

1 සහාය කථිකාචාර්ය, සම්භාව්‍ය භාෂා අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
Email; sksobhitha@gmail.com